**ශීර්ෂය 162 - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 27 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපි වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(i)** | විගණනයට ඉදිරිපත් කළ මාසික ගිණුම් සාරාංශ හා වෙනත් තොරතුරු අනුව වෙනත් ලැබීම් රු.3,276,629,370 ක් වූ අතර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව රු.3,328,349,086 ක් වුයෙන් රු.51,719,716 ක වෙනසක් නිරීක්ෂණය විය. | ගිණුම් සාරාංශ හා මුල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය සසදා නිවැරදි අගය දැක්විය යුතුය. | මෙම තත්ත්වය නිවැරදි කර ගැනීමට මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කරනු ලැබේ. |
| **(ii)** | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව අග්‍රිම ගිණුමේ ශේෂය රු.7,466,002,315 ක් වූ අතර එම ශේෂය අමාත්‍යාංශයේ අග්‍රිම ගිණුම් ශේෂ සමඟ සැසදිම සඳහා අත් මුදල් ගැලපිම් ගිණුම ඉදිරිපත් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කළයුතුවීම. | එම |

**(ආ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(i)** | **වැඩ අත්තිකාරම් ගිණුම** | | |
| | අමාත්‍යාංශය විසින් ඉටු කරමින් පවතින ඉදිකිරීම් කටයුතු සඳහා විශාල මුදලක් වැයකර තිබුණත්, එම වියදම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ කෙරීගෙන යන වැඩ යටතේ දක්වා නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කෙරීගෙන යන වැඩ ගිණුම් ගත කළ යුතුය. | 2018 දෙසැම්බර් 31 දිනට කුලී වැඩ අත්තිකාරම් ගිණුමේ විස්තර පිළියෙල කරන ලද අතර එම තොරතුරු නොපමාව ලබාදීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| **(ii)** | වෙනත් ආයතනයක් සතු | වාහනය පවරා ගැනීමෙන් | පවරා ගැනීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | රු.2,000,000 ක් වටිනා වාහනයක් අමාත්‍යාංශය සතු වාහනයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. | පසුව මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. | කෙරෙමින් පවතී. |

**(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

--------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(i)** | මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව ආදායම් නොවන ලැබීම් රු.24,886,789,229 ක් ලෙස දක්වා තිබුණද මාසික ගිණුම් සාරාංශ හා වෙනත් තොරතුරු අනුව එය රු.24,825,917,877 ක් විය. ඒ අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.60,871,352 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි |
| **(ii)** | මාසික ගිණුම් සාරාංශ අනුව මුදල් ප්‍රවාහයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙනුවෙන් වැය කළ මුදල් ප්‍රවාහය රු.24,817,822,831 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.705,048,186ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව එම වියදම රු.24,112,774,645 කින් අඩුවෙන් දක්වා තිබුණි. | එම | අදහස් දක්වා නොතිබුණි |
| **(iii)** | මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම්වලින් අයකරගත් රු.7,344,892 ක් වූ ණය වාරික ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා නොතිබුණි. | එම | අදහස් දක්වා නොතිබුණි |
| **(iv)** | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කළ මුදල් ප්‍රවාහය රු.31,416,272,152 ක් ලෙස දක්වා තිබුණද මාසික ගිණුම් සාරාංශ අනුව එය රු.15,439,940 ක් වුයෙන් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කළ මුදල් ප්‍රවාහය රු.31,400,832,212 කින් වැඩියෙන් දක්වා තිබුණි. | එම | අදහස් දක්වා නොතිබුණි |

| | | |
|---|---|---|
| **(V)** | අමාත්‍යාංශය විසින් මූල්‍ය එම ක්‍රියාකාරම්වල නිරත වී නොතිබුණත්, ඒ යටතේ රු.231,471,206 ක වැයක් සඳහන් කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි |

## 1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | **නීති, රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) | ලේකම්වරුන් ගේ ව්‍යවස්ථා සංග්‍රහයේ ආ උපලේඛනයේ 03 ඡේදය | 3,676,038 | ලේකම්වරුන්ගේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව අමාත්‍යාංශ ලේකම්වරයාට මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයෙන් වැටුප සහ එම ආයතනයට පමණක් ආවේණික වූ ලේකම්වරයෙකුට හිමි නොවන දිරි දීමනා, ඉංජිනේරු දීමනා, වෘත්තිය දීමනා, බාහිර වෛද්‍ය ප්‍රතිකාර දීමනා සහ ලාභ පදනම් කරගෙන ගෙවනු ලබනු ඵලදායිතා දිමනා 2015 වර්ෂයේ සිට 2018 දක්වා ගෙවීම් කර තිබුණි. ඊට අමතරව ලේකම්වරයාට හිමි සියළු දීමනා අමාත්‍යාංශයෙන් | අමාත්‍යාංශයේ ප්‍රධාන ගනන්දීමේ නිලධාරියාට වැටුප් ගෙවීමේදි ලේකම්වරුන්ගේ ව්‍යවස්ථා සංග්‍රහයේ ප්‍රතිපාදන සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය. | ලේකම්වරයෙකු පත් කිරීමේ බලධාරියා වශයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලිඛිතව ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව මාහට මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යංශයෙන් ගෙවනු ලැබූ වැටුප් හා දීමනා ප්‍රතිපූරණය කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ලබාගෙන තිබුණි. | | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396(ඈ) | 47,892,254 | මාස 06 ක් ඉක්ම වූ නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොකළ චෙක්පත් 14 ක් හා ව්‍යාපෘතියට අදාළව චෙක්පත් 32 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ වන විට අදාළ ගැලපීම් කර නිවැරදි කර ඇත. |
| (ඇ) i) | 2016 මාර්තු 24 දිනැති අංක 1/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය 2.2.4 ඡේදය | 726,212 | උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියේ තනතුරු 5 ක් සඳහා අර්ධකාලීන පදනම මත රාජ්‍ය සේවයේ නිලධාරීන් 5 දෙනෙකුගෙන් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමකින් තොරව බඳවා ගෙන සමාලෝචිත වර්ෂය සඳහා රු.726,212 ක දීමනා ගෙවා තිබුණි. | කළමනාකරණ සේවා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අර්ධකාලීන ලෙස අමාත්‍යාංශයෙන් බඳවාගෙන ඇති නිලධාරීන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගත් වාචික උපදෙස් අනුව ලේකම්තුමාගේ පූර්ණ අනුමැතිය මත ව්‍යාපෘතිය සඳහා බඳවාගෙන ඇත. |
| II | 9.3 ඡේදය | | කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ, ව්‍යාපෘති නියාමන කමිටු රැස්වීම් මාස දෙකකට වරක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘති නියාමන කමිටු රැස්වීම් 2 ක් පමණක් පවත්වා තිබුණි. | ව්‍යාපෘති නියාමන කමිටු රැස්වීම් මාස දෙකකට වරක් පැවැත්විය යුතු වේ. | පිළිතුරු ලබාදී නැත. |

**1.6.3 වංචනික ස්වරූපයේ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හිටපු අතිරේක ලේකම්, | ලබාගන්නා ලද ප්‍රවාහන දීමනාව | අදාළ නිලධාරියා එම වරද |

| | | |
|---|---|---|
| (නාගරික සංවර්ධන) කොළඹ අගනගර නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ වාහනයක් 2015 ඔක්තෝබර් සිට 2016 මැයි දක්වා පූර්ණකාලීනව අනුයුක්තකර තිබියදි රාජකාරී කටයුතු සඳහා පෞද්ගලික වාහනය භාවිතා කරන බව දන්වා රු.340,000 ක් ලබාගෙන තිබුණි. ඉන් රු.150,000 ක් ගෙවා තිබුණද රු.190,000 ක් මේ දක්වා ගෙවා නොතිබුණි. | නැවත ගෙවීමට කටයුතු කළ යුතුය. | භාරගෙන අදාළ මුදලින් කොටසක් පමණක් ගෙවා ඇති අතර ඉතිරි රු.190,000 ගෙවීම පැහැරහැර ඇත. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1** **වියදම් කළමනාකරණය**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ---------- | ---------------------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේදි වැය විෂයයන් 53 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය, සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රතිශතයක් විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කළයුතු වීම. | වර්ෂාවසාන බැරකම් වටිනාකම එක් එක් වැය විෂයයන් වල ඉතිරිවීම් වලින් අඩුකල විට සැළකිය යුතු ඉතිරිකිරීම් ප්‍රතිශතයක් නොපවතින බැවින් නිරීක්ෂණ සමග එකග විය නොහැක. |
| (ආ) | සංවර්ධන උපව්‍යාපෘති 08 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.8,736,000,000 ක ප්‍රතිපාදන ලබාගෙන තිබුණු අතර ප්‍රතිපාදන උපයෝජනයෙන් පසුව රු.6,747,882,946 ක් ඉතිරි වී තිබුණි. එහි ප්‍රතිශතය සියයට 31 ත් 100 ත් දක්වා පරාසයක ප්‍රමාණයක් විය. | පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම මඟින් ප්‍රතිපාදන සලසා ගැනීමේදි නිවැරදි හා තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු විම. | - එම - |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව 2018 වර්ෂයේදි ඉටුකිරීමට සැලසුම් කළ පහත සඳහන් කාර්යභාරයන් සමාලෝචිත වර්ෂයේ දී කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නූතන තිරසාර සංවර්ධන නාගරික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ උපව්‍යාපෘතියක් වන කඩවත පාර, කලුබෝවිල, හා දෙහිවල දියබස්නා මාර්ග දීර්ඝකිරීම හා අලුත්වැඩියා කිරීම හොරණ බස්නැවතුම්පල ඉදිකිරීම - අදියර 5 හා කිරිදිවැල බස්නැවතුම්පල ඉදිකිරීම - අදියර 5 සඳහා පිළිවෙලින් රු.මිලියන 6 ක් රු.මිලියන 10.5ක් හා රුපියල් මිලියන 05 ක ලෙස ප්‍රතිපාදන සලසා තිබුණත් එම කාර්යය ඉටුකර නොතිබුණි. | ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරිමට කටයුතු කළ යුතුය. | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබීම හා ජලනල පද්ධතිය හා විදුලි පද්ධතිය පුනස්ථාපනය කිරීම ප්‍රමාද වීම, සැලසුම් සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලැබී නොතිබීම හේතුවිය. |
| (ආ) | පළාත් 09 තුළ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ හසලක බස්නැවතුම්පොල සංවර්ධනය, දම්ළ දරුවන්ගේ රැඳවුම් නිවස්නය ඉදිකිරීම-රක්වාන - අදියර 2, ඇල්ල පහසුකම් මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම, වැල්ලවාය පොල සංවර්ධනය, රත්මලාන බෙලෙක්කඩේ පොල සංවර්ධනය කිරීම, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාර්ග වැඩිදියුණු කිරීම, මට්ටක්කුලි කාක දූපතේ වෙරළ උද්‍යාන උත්සව ශාලාව ඉදිකිරීම සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 20 ක් 22 ක් 40 ක් 60 ක් 60 ක් 15 ක් හා 150 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද එම කාර්යයන් ඉටුකර නොතිබුණි. | ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරිමට කටයුතු කළ යුතු විම. | ඉටුකර නැත |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම.**
-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බස්නාහිර කළාපීය සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතියට 2017 හා 2018 වර්ෂවල රුපියල් මිලියන 44.27 ක් වැයකර තිබුණ ද ශක්‍යතා අධ්‍යනයක් හෝ වෙරළ තීරයට සිදුවන පරිසර බලපෑම් තක්සේරු කිරිමේ වාර්තාවක් ලබානොගෙන, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘතිය යටතේ යෝජිතව තිබු වරාය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ වැලිසර නාවික හමුදා කඳවුර ආශ්‍රිතව සැපයුම් සේවා මධ්‍යස්ථානයක් ඇති කිරිම යන සංරචකයන් අත්හැර තිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ශක්‍යතා අධ්‍යයන හා පරිසර බලපෑම් තක්සේරු කිරීමේ වාර්තා ලබාගත් පසු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කළ යුතු වීම. | මෙහි ශක්‍යතා අධ්‍යන කටයුතු NARA ආයතනයට ලබා දී ඇති අතර කිඹුලා ඇල (බිලුමැන්ඩල්) ප්‍රදේශය සංවර්ධනය කිරීමේ කාර්යය නාගරික සංවර්ධන අධිකාරිය මගින් පිළියෙල කරන ලද නාගරික සංවර්ධන සැලසුම් 2030 නව මූලික සැලැසුම් කළාපය අනුව සංශෝධනය කර ඇත. |
| (ආ) | ගුවන් නගර සංවර්ධන ව්‍යාපෘතියට 2017 හා 2018 වර්ෂවලදී රු.මිලියන 75 ක් වියදම් කර තිබුණ ද ශක්‍යතා අධ්‍යනයන් හා පරිසර බලපෑම් තක්සේරු කිරිමේ වාර්තා ලබා ගෙන නොතිබුණි. නිශ්චිතව සංවර්ධන කාර්යයන් හදුනාගෙන නොතිබුණි. | එම | මෙම ව්‍යාපෘතිය සැලසුම් කිරීමට 2017 වර්ෂයේ කොරියාවේ ඉඩම් යටිතල පහසුකම් හා ප්‍රවාහන අමාත්‍යංශය භාරගෙන තිබුණත් එය ක්‍රියාවට නැංවීමට කොරියානු අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පිටකොටුව මැනිං වෙළඳපොල ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ ඉඩම පිරවීම හා අපවහන පද්ධතිය සැකසීම සඳහා රු.415,072,322 ක ගිවිසුමකට එළඹ තිබූ අතර මාස 08 ක් ප්‍රමාද වී අදාළ කාර්යභාරය නිමකර කාණු පද්ධතිය ඉදිකිරීම් කටයුතු සඳහා රු.114,520,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද එම කාර්යය නවතා තිබුණි. අමතර වශයෙන් බිම් සංවර්ධනය කිරිම සඳහා සහ අමතර පිරවීම සඳහා රු.65,529,402 ක අමතර වියදමක් කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර වන ටැඹ යෙදිමේ කාර්යය රු.484,378,452 ක වටිනාකමකට පුද්ගලික ආයතනයකට පවරා තිබුණද ගිවිසුම්ගත දිනයන්ට වඩා දින 20 ක් ප්‍රමාද වී කාර්ය නිම කිරිම මත ගිවිසුමේ කොන්දේසි අනුව රු.7,000,000 ක් වූ ප්‍රමාද ගාස්තු අයකිරිමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදි හා ගෙවීම් කිරීමේදි කොන්ත්‍රාත් ගිවිසුම අනුව කටයුතු කළ යුතු විම. | එවකට පැවති පස් සැපයීමේ හිගය සහ ඉංජිනේරුමය උපදෙස් මත භූමිය සංවර්ධනය කිරීම සඳහා 2016 දෙසැම්බර් 15 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණු බැවින් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකළ යුතු දින 15 සඳහා ප්‍රමාද ගාස්තු ලෙස රු.3,333,625 ක් අයකරගෙන ඇත. |
| (ඇ) | කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 240.84 ක් (එ.ජ.ඩො.මිලියන 1.52) ක් වූ දුනුමඩලාව ජල පිරිපහදු ව්‍යාපෘතියේ (Rehabilitation of Dunumadalawa Water Treatment Plant) ප්‍රතිසංස්කරණ කටයුතු 2017 සැප්තැම්බර් 24 දින අවසන් වීමට නියමිතව තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි භෞතික ප්‍රගතිය සියයට 90 ක් පමණක් වී තිබුණි. කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු (LD) අයකර ගැනීමට ව්‍යාපෘතිය අපොහොසත්ව තිබුණි. | ප්‍රමාද කාලය වෙනුවෙන් කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු අයකරගැනීමට කටයුතු කළ යුතු විම. | පිළිතුර ලබා දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 24.22 (එ.ජ.ඩො. මිලියන 0.16) ක් වූ ආතර් සීට් නැරඹුම් වේදිකාව පුනරුත්ථාපන (Rehabilitation of Arthur’s seat viewing deck) කටයුතු නිම කර තිබුණද එම ස්ථානයට විදුලි පහසුකම් සපයා නොතිබූ අතර, සවි කර තිබූ විදුලි මෙනු උපකරණ කඩා බිද දමා තිබූ බව ස්ථානීය පරීක්ෂාවේදි නිරීක්ෂණය විය. | මෙම ව්‍යාපෘතියේ කටයුතු අවසන්කර යෝජිත කාර්යය සඳහා යොදවා ගැනීමට කටයුතු කළයුතු වීම. | ආතර් සිටි නැරඹුම් මධ්‍යස්ථානයේ පළමු කොටස ආරක්ෂා කර ගැනීම සඳහා මහනුවර මහනගර සභාවට පවරා ඇත. විදුලිය සැපයුම දෙවන අදියර යටතේ සිදුකළ යුතුවීම. |

**3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම.**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ---------------- | ----------------------- |
| (අ) | 2017 හා 2018 යන වර්ෂවල අවසන් කරන ලද රු.මිලියන 678.1 ක් වූ ව්‍යාපෘති 15 ක් අදාළ පාර්ශවයන්ට භාරදී නොතිබීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත නොහැකිවී තිබුණි. | වැඩකටයුතු අවසන් වූ ව්‍යාපෘති අදාළ පාර්ශවයන්ට භාරදීමට කටයුතු කළ යුතුය. | මෙම ව්‍යාපෘතීන් විවිධ හේතූන් මත භාරදීමට නොහැකි වී ඇත. |
| (ආ) | කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකළ බැද්දගාන ජෛව විවිධත්ව උද්‍යානයේ කටයුතු නියමිත ප්‍රමිතයට හා නියමිත පරිදි ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබුණද, කොන්ත්‍රාත්කාර ආයතනය වෙත රු.මිලියන 92.07 ක් ගෙවීම් කර තිබුණි. | ජෛව විවිධත්ව උද්‍යානයේ කටයුතු නියමිත ප්‍රමිතයට හා නියමිත පරිදි ඉදිකිරීම් කටයුතු සිදුකළ යුතුය. | කොන්ත්‍රාත්තුකරු වෙත ගෙවා තිබූ රු. 4,296,530 මුදලක් නැවත අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | මට්ටක්කුළිය කාක දූපත වෙරළ උද්‍යානය ඉදිකිරීම සඳහා රු.මිලියන 275.78 කට කොන්ත්‍රාත් මුදලකට කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව මාස 10 ක කාලයක් තුළ කොන්ත්‍රාත්තුවේ කටයුතු නිමකිරීමට සැලසුම්කර තිබුණද, වෙරළ උද්‍යානය ඉදිකිරීම් නිමකිරීමට වර්ෂ 01 ½ කට වැඩි කාලයක් ගතකර තිබුණි. ඇතැම් අයිතම් නියමිත ඉංජිනේරු සැලැස්ම අනුව නියමිත ප්‍රමිතින්ට අනුව ඉදිකිරීම් කටයුතු නොකිරීම නිසා වෙරළ උද්‍යානයේ ඉදිකිරීම් වල අඩුපාඩු 47 ක් තිබියදි උද්‍යානය | වෙරළ උද්‍යානයේ ඉදිකිරීම් වල අඩුපාඩු කොන්ත්‍රාත් කාර ආයතනයෙන් ඉටුකරවා ගැනීමට කටයුතු කළ යුතුය. | කාලය දීරඝ කිරීම නිවැරදි කිරීමට කටයුුතු කර ඇත. |

බාරගෙන තිබුණි. එම අවස්ථාව වන විට අඩු පාඩු පිළිබඳ සලකා බැලීමෙන් තොරව කොන්ත්‍රාත්කරුට රු.මිලියන 129.14 ක් ගෙවා තිබුණි.

**3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ටොරිංටන් හා මෝදර උමං සැලසුම් කිරීමේ හා ඉදිකිරීමේ ව්‍යාපෘතිය ඇ.එ.ජ.ඩොලර් 32,098,189 කට චීන සමාගමක් සමඟ 2018 මැයි 30 දින ගිවිසුමට එළඹ වර්ෂ 02 කින් නිමකළ යුතු වුවත් සැලසුම් කාර්යයන් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. එසේම ඉදිකිරීම් කාර්යයන් හෝ ප්‍රධාන උපකරණ ස්ථානගත කිරීමේ කාර්යයන් ඉටුකර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය අවසානය වන විටද දින 11 සිට 71 දක්වා ප්‍රමාදයක් පවතින බැවින් ව්‍යාපෘතිය කඩිනමින් නිම කළ යුතුය. | නිරීක්ෂණ සමග එකඟ නොවේ. |
| (ආ) | ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට උපදේශකවරයා විසින් සකස් කරන ලද කාර්යසාධන වාර්තාවට අනුව සැලසුම්වල (Designing) කාර්යසාධනය ලෙස සියයට 50 ක් දක්වා තිබුණද, සැලසුම් තත්ත්වය දක්වන වාර්තාව (Designing Status Report) අනුව, මුළු සැලසුම් 102 අතරින්, සැලැසුම් 03ක් පමණක් වැඩ නිමකර තිබුණු අතර ඉතාම අඩු කාර්යසාධනයක් තිබියදී සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඇ.එ.ජ. ඩොලර් 333,564ක් හෙවත් සියයට 34 ක වැනි ඉහළ වටිනාකමක් ගෙවා තිබුණි. | ව්‍යාපෘතියේ සත්‍ය කාර්යසාධනය අනුව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දී නැත. |

**3.5** **විදේශ ආධාර ව්‍යාපෘති**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------------- | ------------------------- | ------------------ |
| (අ) | **කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය**<br>-------------------------------------------------- | | |
| **(i)** | බේරේ වැව රේඛීය උද්‍යානය ඉදිකිරීම අදියර I යටතේ ගංවතුර හා ජල සම්පත් කළමනාකරණ පද්ධතියක් (RTC) ස්ථාපිත කිරීම සඳහා ඇස්තමේන්තු කළ රු.මිලියන 390 කින් රු.මිලියන 105.5 ක් 2018 දෙසැම්බර් 31 දින වන විට වැයකර තිබූ අතර භාණ්ඩාගාර විශේෂ අනුමැතියකින් තොරව හා 2016 මාර්තු 24 දිනැති අංක 1/2016 දරන චක්‍රලේඛයට පටහැනිව අදාල අංශයේ උපදේශකවරයා සඳහා මසකට රු.920,000 බැගින් 2018 වර්ෂය අවසාන වන විට රු.24,740,000 ක් මුළු පරිශ්‍රමිකයක් ගෙවා තිබුණි. එසේම කාර්යසාධනය ඇගයීමකින් තොරව මෙම නිලධාරියාගේ සේවා කාලය වසර 3 කින් දිර්ඝකර තිබූ අතර 2019 මැයි මස අවසන් වන විටද මෙම උපව්‍යාපෘතියේ කටයුතු පවත්වාගෙන යාම සඳහා ස්ථිර කාර්යමණ්ඩලයක් පුහුණු කිරීමට හා අනුයුක්ත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පාරිශ්‍රමික සම්බන්ධ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ ප්‍රතිපාදන අනුව මෙම අංශයේ වැටුප් ගෙවීමට කටයුතු කළ යුතු අතර නොමිලේ ලබාගත හැකි සේවාවන් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින් වියදම් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දී නැත. |
| **(ii)** | දැව වැඩ සඳහා රු.9,683,132 ක් ගෙවා තිබුණත් ඒ සඳහා (Wood Works) දැව පරීක්‍ෂණ වාර්තා (Timber Test Reports) ඉදිරිපත් කර නොතිබුණු හෙයින් දැව ඉදිකිරීම්වල ගුණත්වය පිළිබඳ තහවුරු කර ගැනිමට නොහැකි විය. දැව වැඩ සඳහා රු. 1,805,832 ක් ගෙවා තිබූ අතර ඒ සඳහා අදාළ දැව පරීක්‍ෂණ වාර්තා ලබා නොගැනීම නිසා නැවත එම මුදල් අඩුකර මුදල් ගෙවා ඇති බව නිරීක්‍ෂණය විය. | දැව පරීක්‍ෂණ වාර්තා (Timber Test Reports) ලබාගෙන එම දැව ඉදිකිරීම්වල ගුණත්වය පිළිබඳ සෑහීමකට පත්වීමෙන් අනතුරුව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දී නැත. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අංක 14.6 ප්‍රකාරව බිල්පත්වලට අදාල සියළුම තොරතුරු හා මූලාශ්‍ර ලියවිලි ලැබුණු පසුව උපදේශකවරයා විසින් බිල්පත් අනුමත කළ යුතුව තිබුණි. එම කොන්දේසිවලට පටහැනිව ඉදිකිරීම් අයිතම 3 ක් වෙනුවෙන් රු.4,182,845 ක් වොරන්ටි බලපත්‍ර පිළිබඳ නොසලකා කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අංක 14.6 ප්‍රකාරව බිල්පත්වලට අදාල සියළුම තොරතුරු හා මූලාශ්‍ර ලියවිලි ලැබුණු පසුව උපදේශකවරයා විසින් බිල්පත් අනුමත කළ යුතුය. | පිළිතුරු ලබා දී නැත. |

## 3.6 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘති කටයුතු නඩත්තු වෙනුවෙන් රු.මිලියන 278.67 ක් වටිනා යන්ත්‍ර, උපකරණ මිලදී ගෙන මහනුවර, ගාල්ල නගර සභාවන්ට හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණද ඒවා නිශ්ක්‍රියව පවතින බව විගණනයේදි නිරික්ෂණය විය. එසේම එම යන්ත්‍ර, උපකරණ ව්‍යාපෘති කටයුතු සඳහා යොදවන්නේද යන්න පිළිබඳව ව්‍යාපෘතිය විසින් නිසි අධික්ෂණයක් සිදු කර නොතිබුණි. | එකී ආයතන වලට අත්‍යවශ්‍ය යන්ත්‍ර හා උපකරණ හඳුනාගෙන ඒවා ලබාදීමට කටයුතු කළ යුතු අතර එලෙස කටයුතු කිරිමෙන් තොරව ආයතනවල අවශ්‍යතාවට වඩා යන්ත්‍ර උපකරණ ලබාදීමට කටයුතු නොකළ යුතු වීම. | මහනුවර මහනගර සභාව හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති යන්ත්‍රෝපකරණ පිළිබඳව ඉන්වෙන්ටරි හා තොග පොත්වල සටහන් කර ඇති බවත් නඩත්තු නිවාරණ කටයුතු සිදුකරමින් ඉතාමත් ඵලදායි ලෙස එම උපකරණ භාවිතා කරන බවත් මහනුවර මහනගර සභාව හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව දන්වා සිටී. |
| (ආ) | 2016 වර්ෂයේදි උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය විසින් මිලදී ගත් රු. මිලියන 120.59 (ඇ.ඩො. මිලියන 0.85) ක් වටිනා DI සහ PE බට සහ උපාංග සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භාවිතයට ගෙන නොතිබුණු අතර එම තොගයන්ට අදාළ තොග වාර්තා ව්‍යාපෘතිය විසින් නඩත්තු කර ද නොතිබුණි. මෙම තොගය ජාතික ජල ප්‍රසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය භාරයේ පැවැති අතර තොගවලට අදාළ භාණ්ඩ සමීක්ෂණයක්ද ව්‍යාපෘතිය විසින් සිදු කර නොතිබුණි. | ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදී ගන්නා ලද උපාංග සම්බන්ධයෙන් නිසි නඩත්තුවක් කිරීම මෙන්ම අදාළ තොග සම්බන්ධයෙන් නිසි පරිදි භාණ්ඩ සමීක්ෂණයන් සිදු කළ යුතුය. | මෙම බට හා උපාංග මාර්ග කොන්ත්‍රාත්තුව අවලංගුකිරීමේදී ඒවා මහනුවර මහනගරසභාවට හා ජලසම්පාදන මණ්ඩලයට භාරදීමට කටයුතු කරන ලදී. |

### 3.7 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 ජුනි මස රු.1,614,963,362 කට ගිවිසුම් අත්සන් කරන ලද කටුගස්තොට මඩවල මාර්ගය 2018 ජුලි මස අවසන් කළ යුතු අතර 2018 වර්ෂයේදී රු.668,925ක් වැයකර තිබුණි. එහෙත් කොන්ත්‍රාත්තුව අතරමඟ නතර කිරීම හේතුවෙන් ආයතනයට සිදු වූ පාඩුව රු.429,038,712 ක් වී තිබුණි. | ව්‍යාපෘතියට අදාළ ඉදිරිකටයුතු නව කොන්ත්‍රාත්කරු සමගින් කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතුය. | ඉඩම් අත්පත්කර ගැනීමේදී ගතවූ කාලයත් උප ව්‍යාපෘති සැලසුම් කිරීමට සහ අනුමත කිරීමට ගත වූ කාලයත් ප්‍රදානය කරන ලද ව්‍යාපෘතිවල කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍යමය දූර්වලතාවයත් දුර්වල ප්‍රගතියට හේතුවිය. |

### 3.8 විසඳා නොතිබුණු විගණන ඡේද

අමාත්‍යාංශයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු සහ පසුවිපරම් කටයුතු නිම නොවූ ඡේද පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2016 | එච්යූඩී/බී/එම්සීයූඩීපී/04/16/03 හි 3.4 ඡේදය | කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවන ව්‍යාපෘති නියෝජිත ආයතනවලට සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට ද්විතීය පදනම මත හා අර්ධ කාලීන පදනම මත සේවය කරන නිලධාරීන්ට වැටුප් ගෙවීමේදී ඔවුන් දරන තනතුරට අදාළ මූලික වැටුප අනුව ගණන් බලා ව්‍යාපෘතියේ සේවය කිරීම වෙනුවෙන් දීමනා ගෙවීම වෙනුවට ඔවුන්ට හිමිකම් නොමැති සියයට 15 සහ සියයට 5 විශේෂ දීමනා ද ගණනය කර වැටුප් ගෙවා තිබූ අතර එසේ ගෙවූ රු. මිලියන 10.83 ක වැටුප ආපසු අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. |
| 2017 | එච්යූඩී/බී/එම්සීයූඩීපී/04/17/04 හි 3.5(අ) ඡේදය | මෝදර නව උමං ජල මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු පහසු කරවීම සඳහා සහ ව්‍යාපෘතිය සඳහා උපකරණ තබාගැනීමට 2017 අගෝස්තු මාසයේ සිට 2018 මැයි මාසය දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා අක්කර 01 රූඩ් 01 පර්චස් 20 ක ඉඩමක් මාසිකව රු.1,100,000 කුලියකට මාස 10 ක් සඳහා රු. මිලියන 11 කට ලබාගෙන තිබුණත් එම කාලසීමාව තුළ ඉඩම කිසිදු පරිහරණයක් කර නොතිබූ බැවින් දරන ලද නිශ්ඵල වියදම ආපසු අයකරගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. එසේම එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණේ 2018 ජුනි මස බව නිරීක්ෂණය විය. |

| | | |
|---|---|---|
| 2015 | එච්යූඩී/බී/එම්එම්ඩබ්ලිව්/ඩී/2015/08 හි 3.11(ඇ) ඡේදය | 2016 මාර්තු 09 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛයේ 2(iii),(iv) ඡේදවලට පටහැනිව හිටපු අතිරේක ලේකම් (නාගරික සංවර්ධන ) විසින් තම නිලවාහනය සඳහා ඉන්ධන දීමනා වැටුපට එකතුකර ලබාගනිමින් තිබියදීම, තවත් ව්‍යාපෘති දෙකකින් චක්‍රලේඛ වලට පටහැනිව ලබාගෙන තිබුණු ඉන්ධන වල පිරිවැය වූ රු.465,080 අදාළ නිලධාරියාගෙන් මෙතෙක් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. |
| 2016 | එච්යුඩී/බී/එම්සියුඩීපී2016/ව07 | කොන්ත්‍රාත් පදනම මත ව්‍යාපෘතියක් සඳහා කෙටි කාලීන සේවයට බඳවාගත් නිලධාරියෙකුට, පශ්චාත් උපාධි/ඩිප්ලෝමාවක් හැදෑරීමට පාඨමාලා ගාස්තු, භාණ්ඩාගාරයෙන් ව්‍යාපෘතිය සඳහා ලබාදෙන ප්‍රතිපාදන උපයෝජනය කර ගෙවීම් කළ නොහැකි වුවත්, කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන විශේෂඥවරයා ලෙස සේවය කළ නිලධාරියාට පශ්චාත් උපාධියක් හැදෑරීම සඳහා වැරදි ලෙස ගෙවීම් කර තිබුණු රු. 150,000 ක මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**3.9 කළමනාකරණ දූර්වලතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියට 2017 වර්ෂයේ මාර්තු මස සිට කුලී පදනම මත වාහන 05 ක් ලබාගෙන තිබු අතර එකී වාහන සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 12,614,391 ක් වැයකර තිබුණි. කෙසේවුවද කුලී පදනම මත ලබාගත් වාහනවලින් බොහොමයක මාසික ධාවන දුර කිලෝමීටර් 1000 ට වඩා අඩුව පැවති අතර එයින් වාහන 02 ක් නියැදි පරීක්‍ෂණයට ලක්කර මාස ගණනක ධාවන දුර කිලෝමීටර් 500 ට වඩා අඩු දුරක් ධාවනය කර තිබුණි. | ව්‍යාපෘතිය සතු වාහන ඵලදායීව භාවිතා කර කුලීපදනම මත වාහන ලබාගැනීම සඳහා දරණ වියදම් අවම කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නැත |
| (ආ) | ව්‍යාපෘතියේ ඉහළ තනතුරු විශාල වශයෙන් පුරප්පාඩු පවතින අතර ව්‍යාපෘති කාර්යයන් ඉටුකර ගැනීම සඳහා උපදේශකවරුන් විධිමත් අනුමැතියකින් | | |

| | | | |
|---|---|---|---|
| | තොරව බාහිරින් බඳවාගෙන තිබුණි. එහිදි පරිසර, සමාජ , සන්නිවේදන ,කොන්ත්‍රාත් හා ප්‍රමාණ සමීක්ෂණ යන අංගයන් සඳහා රු.100,216,739 ක් උපදේශක ගාස්තු වශයෙන් 2018 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබු අතර ඉංජිනේරු උපදේශකවරුන් සඳහා 2017,2018 වර්ෂයන් සඳහා රු.53,962,909 ක් ගෙවා තිබුණි. මෙම උපදේශකවරුන් සඳහා වාර්ෂිකව කාර්යසාධන ඇගයීම් සිදුකිරීමකින් තොරව ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසන් වන තෙක් ඔවුන්ගෙන් සේවාවන් ලබාගැනීමට කටයුතු කර තිබු අතර උපදේශකවරුන්ගේ වැටුප් හා දීමනා සම්බන්ධයෙන් කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2015 හි 10 ඡේදය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | | |
| (ඇ) | **උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය**<br>**-----------------------------------------** | | |
| (i) | ගාල්ල , මහනුවර හා යාපනය නගර සංවර්ධනය සඳහා පිළිවෙලින් රු.මිලියන 3700 ක හා 1400 ක ප්‍රතිපාදන සලසා තිබුණද වැයකර තිබුණේ රු.මිලියන 2,386 ක් හා 313 ක් පමණි. එය අනුපිළිවෙලින් සියයට 36 ක් හා සියයට 78 ක් විය. තවද ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 796.43 ක් වූ මහනුවර ධර්මාශෝක පාර ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ මූල්‍ය හා භෞතික කාර්යසාධනය පිළිවෙලින් සියයට 50 ක් හා සියයට 43 ක් වී තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ හැකියාව ඇත්නම් පමණක් ප්‍රතිපාදන සලසා ගැනීම සිදුකල යුතුවීම. | ගාල්ල හා මහනුවර නගර සංවර්ධන ව්‍යාපෘති දෙකෙහි ඉඩම් අත්පත්කර ගැනීම සඳහා වැඩිකාලයක් ගතවීම නිසා සැලසුම් කළ කාලය තුළ ප්‍රදානය කිරීමට නොහැකිවීම හා යාපනය නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි මූල්‍ය හැකියාවන් නොමැතිවීම. |
| **(ii)** | ව්‍යාපෘතිය නියමිත කාලපරිච්ඡේදය තුල වැඩ නිමකිරීමට අපොහොසත්වීම මත මහනුවර බහුකාර්ය ප්‍රවාහන පර්යන්තය ඉදිකිරීමට ජාත්‍යන්තර සංවර්ධන ආයතනය ලබාදියයුතුව තිබු රු.මිලියන 9316.6 ක මුදල අත්හිටුවා තිබුණි. මෙම ඉදිකිරීමට රු.මිලියන 156.81 ක් වැයකර තිබුණි. | ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළයුතුවීම. | සම්පූර්ණ ප්‍රමාද ගාස්තු මුදල වන රු.මිලියන 11 අයකරගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | රු.මිලියන 240.84 ක් දුනුමඩලාව ජල පිරිපහදු ව්‍යාපෘතියෙහි වැඩ 2017 වර්ෂයේදි නිමකිරීමට නියමිත වුවද සමාලෝචිත වර්ෂය අවසානයට එහි භෞතික ප්‍රගතිය සියයට 90 ක් වූ අතර ප්‍රමාද ගාස්තු අයකරගෙන නොතිබුණි. | ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළයුතුවීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඇ) | **කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය**<br>-------------------------------------------- | | |
| (i) | සංරචක I යටතේ ගංවතුර හා ජලාපවහන කළමනාකරණය (Flood and Drainage Management) යටතේ රු.මිලියන 17,905ක් වූ කොන්ත්‍රාත්තු 18ක් සිදුකළ යුතු වුවත්, එම කටයුතු සමාලෝචිත වර්ෂයේදි සිදුකර නොතිබුණි. | ආරම්භකරන ලද ව්‍යාපෘති හැකි ඉක්මනින් නිමකිරීමට කටයුතු කළයුතුවීම. | පිළිතුරු ලබා දී නැත. |
| (ii) | උප ව්‍යාපෘති 03 ක කිසිදු කාර්යසාධනයක් නොවූ අතර ව්‍යාපෘති 05ක කාර්යසාධනය සියයට 50 ට අඩු මට්ටමක පැවතුනි. උප ව්‍යාපෘති 34 ක වැඩ කටයුතු නිම කිරීමට ඇස්තමේන්තු කාලයට වඩා මාස 1 සිට 10 දක්වා කාල ප්‍රමාදයකින් යුතුව නිමකර තිබුණ ද ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. | ආරම්භකරන ලද ව්‍යාපෘති හැකි ඉක්මනින් නිමකිරීමට කටයුතු කළයුතුවීම. | පිළිතුරු ලබා දී නැත. |
| (iii) | ව්‍යාපෘතියට අදාළ උප ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන කටයුතු සඳහා මාස 10 හෝ ඊට වැඩි කාලයක් ගතකර තිබුණත් එය සමස්ථ ව්‍යාපෘතියේ කාර්යසාධනය අඩුවීම කෙරෙහි සෘජුවම බලපා තිබුණි. | ව්‍යාපෘතිවලට අදාල ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කළ පරිදි ඉටුකිරීමට කටයුතු කළයුතුවිම. | - එම - |
| (iv) | 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය මඟින් අවසන් කර තිබූ හා තවදුරටත් අවසන් කිරිමට නියමිතව තිබූ උප ව්‍යාපෘතින් 56 ක් පැවති අතර ඉන් උප ව්‍යාපෘති 11 කට අදාළව ව්‍යාපෘති නිමකළ යුතු දිනයත්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘති නිමකර භාරදුන් දිනයත් අතර හඳුනාගත් ප්‍රමාද කාලය වර්ෂ 01 ක සිට වර්ෂ 02 ½ක් දක්වා වූ කාල පමාවක් සිදුකර තිබුණි. | ව්‍යාපෘති හැකි ඉක්මනින් නිමකිරීමට කටයුතු කළයුතු වීම. | - එම - |

| | | | |
|---|---|---|---|
| (v) | ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන විශේෂ ඩොලර් ගිණුමේ 2018 ජනවාරි 01 දිනට රු.මිලියන 647.35 කට සමාන එ.ජ.ඩො. මිලියන 4.23 ක ශේෂයක් පැවතුණි. ඊට අමතරව රු.මිලියන 2,939.46 කට සමාන එ.ජ.ඩො. මිලියන 18.80 ක් සමාලෝචිත වර්ෂය තුළ ආපසු ලබාගෙන තිබුණි. එබැවින් ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා මූල්‍ය අවශ්‍යතාවයන් පිළිබඳ දුර්වල පුරෝකථනය හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,799.21 කට සමාන එ.ජ.ඩො. මිලියන 9.84ක් විශේෂ ඩොලර් ගිණුමේ අතිරික්තව පැවතුණි. | ව්‍යාපෘතිය සඳහා වන මූල්‍ය අවශ්‍යතායන් පිළිබඳ පුරෝකතනයන් නිවැරදිව කිරීමට කටයුතු කළ යුතු විම. | 2018 දෙසැම්බර් 31වන දින ඇ.ඩො.9.84ක් එකතු වීමට මූලික හේතුව වූයේ 2018 වර්ෂයේ 03 සහ 04 වන කාර්තුවල වූ දුර්වල ප්‍රගතිය නිසාය. |
| (ඉ) | මහකොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය යටතේ දියවන්නා ඔය පුළුල් කිරීම සඳහා පවරා ගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි මුදල් තක්සේරු කිරිම සහ වන්දි ගෙවීම කඩිනම් කිරිමට අමාත්‍යාංශය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණු බැවින් මු.පි.කො.9519 හි කැබලි අංක 01 හා 02 සඳහා වන්දි ගෙවීම ප්‍රමාද වීම මත එක්තරා පෞද්ගලික සමාගමක් විසින් ආයෝජන ආරවුල් නිරවුල් කිරීමේ ජාත්‍යන්තර මධ්‍යස්ථානය වෙත ශ්‍රී ලංකා රජයට එරෙහිව පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණු අතර, ඒ සඳහා විදේශ නිති උපදේශකයන්ගේ සහාය ලබාගැනීම වෙනුවෙන් නීති ගාස්තු සහ ඒ වෙනුවෙන් පෙනී සිටි නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ විදේශ ගමන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී අමාත්‍යාංශයට රු. 261,101,492 ක වියදමක් දැරිමට සිදුවී තිබුණි. එසේම ඉදිරියේදී තවදුරටත් දැරිය යුතු වියදම පිළිබඳව නිශ්චිතව දැක්විය නොහැකි බවද ලිපිගොනු අනුව තහවුරු වේ. | දියවන්නා ඔය පුළුල් කිරිම සඳහා පවරා ගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි මුදල් තක්සේරු කිරිම සහ වන්දි ගෙවීම කඩිනම් කිරිමට අමාත්‍යාංශය විසින් පියවර ගත යුතුය. අමාත්‍යාංශට ගෙවීමට සිදුවූ රු. 261,101,492 ක අනාර්ථික වියදම, ප්‍රමාදයට වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | 2017 -01-03 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මගින් නඩුවට අදාළ නීතිගාස්තු ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කිරීමට අනුමැතිය ලබාගෙන තිබුණි. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව 2015-2030 කාලය තුළ ළඟා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට 2017 අංක 19 දරණ තිරසර සංවර්ධන පනත අනුව එක් එක් රාජ්‍ය ආයතන බැදී පවතින නමුත් අමාත්‍යාංශය විසින් ප්‍රවර්ථන වර්ෂය සඳහා තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක හඳුනාගෙන, ඒ අනුව අරමුණු හා ඉලක්ක මැනීම හා නියාමනය කිරීම සඳහා දර්ශක හඳුනාගැනීම, පාදක දත්ත හඳුනාගැනීම හා වාර්ෂික ඉලක්ක හඳුනාගැනීමක්ද සිදුකර නොතිබුණු අතර අමාත්‍යාංශයේ තිරසර සංවර්ධන ඉලක්ක ඉටු කර ගන්නා අයුරු පෙන්වමින් එහි ක්‍රියාකාරි සැලැස්මද පිළියෙල කර නොතිබුණි. | සංවර්ධන අරමුණු සහ ඉලක්ක හඳුනාගෙන, ඒ අනුව අරමුණු හා ඉලක්ක මැනීම හා නියාමනය කිරීම සඳහා දර්ශක හඳුනාගැනීම, පාදක දත්ත හඳුනාගැනීම හා වාර්ෂික ඉලක්ක හඳුනාගැනීමටද තිරසර සංවර්ධන ඉලක්ක ඉටු කර ගන්නා අයුරු පෙන්වමින් ක්‍රියාකාරි සැලැස්මද පිළියෙල කළ යුතුය . | පිළිතුරු ලබා දී නැත. |